7. පශ්චාද් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය

නිපුණතා මට්ටම ඃ 7.1 ඉන්දීය ඉතිහාසයට බලපෑමක් කළ විදේශීය රාජවංශ පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1) 1. පශ්චාද් මෞර්ය යුගයේ දී ඉන්දියාවේ ඉතිහාසයට බලපෑම් කළ විදේශීය රාජවංශ 4ක් නම් කරන්න. (ලකුණු 04)

2. "පශ්චාද් මෞර්ය යුගයේ දී ඉන්දියාවට පැමිණි විදේශීය රාජවංශ ඉන්දීය ඉතිහාසයට බලපෑම් කර ඇත". මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විමසන්න. (ලකුණු 12)

2) 1. කුෂාණවරුන්ගේ නිජ භූමිය නම් කරන්න. (ලකුණු 02)

2. කුෂාණවරුන් අයත් ව සිටි ගෝත්‍රය කුමක් ද? (ලකුණු 02)

3. කුෂාණ රාජවංශයේ පළමු පාලකයා කවුද? (ලකුණු 02)

4. "කනිෂ්ක රජු කුෂාණ රාජවංශයේ ශ්‍රේෂ්ඨත ම පාලකයා ය" විමසන්න. (ලකුණු 10)

3) "දේශීය රාජවංශයක් වන සාතවාහනයන් විසින් ඩෙකානයෙහි මුල් ම අධිරාජ්‍යය පිහිටුවන ලදී". මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විමසන්න. (ලකුණු 16)

4) පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න

i) ශුංග රාජවංශය
ii) මිනැන්ඩර් රජතුමා
iii) ශක රාජවංශය
iv) ගාන්ධාර හා මථුරා කලා සම්ප්‍රදායන්
v) අමරාවතී හා නාගර්ජුණකොණ්ඩ කලා සම්ප්‍රදායන්

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)